සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය - I** | **කාලය පැය 01 යි.**

**නම/ විභාග අංකය:**

සැ.යු. :-

- **නිවැරදි පිළිතුර සලකුණු කරන්න.**

01. සියලුම ස්වර ශුද්ධව යෙදෙන රාගය වන්නේ,

(1) යමන් ය (2) කාෆි ය (3) භෛරවී ය (4) බිලාවල් ය

02. ග්‍රැමෆෝන් තැටි යුගයේ ගැයූ ගීතයකි.

(1) ආදරයේ උල්පත වූ අම්මා (2) සසර වසන තුරු
(3) සිරි බුද්ධගයා විහාරේ (4) ලොවේ සැමා එකම දෑයේ

03. ඖඩව ජාතියට අයත් රාගයකි.

(1) භූපාලි (2) බිලාවල් (3) යමන් (4) කාෆි

04. | උ ද s | ය ට s | පා s s | ය න s | මෙම ගී පාදයේ සඳැස්මත් සහ ගීමත් ගණන පිළිවෙලින්,

(1) 6 - 10 (2) 8 - 12 (3) 6 - 12 (4) 8 - 10

05. රි <u>නි</u> ධ <u>නි</u> , ප ධ ම ප ........ ස්වර සංගතිය යෙදෙන රාගය වන්නේ,

(1) බිලාවල් වේ. (2) යමන් වේ. (3) කාෆි වේ. (4) භූපාලි වේ.

06. අනාඝාතාත්මක පැදියක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) රන් දැකිති ගෙන නිති සැරසෙනවා (2) දොයි දොයි දොයි දොයිය බබා
(3) මලේ මලේ අර නාමල නෙළා වරෙන් (4) ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ

07. මුල් යුගයේ ජනප්‍රිය සිංහල කපිරිඤ්ඤා ගායකයෙකි.

(1) ඩබ්. ඇල්බට් පෙරේරා (2) වොලී බැස්ටියන්
(3) සුනිල් පෙරේරා (4) රෝහණ බැද්දගේ

08. ශුද්ධ ගාන්ධාරය සහ ශුද්ධ නිශාධය විවාදි ස්වර ලෙස යොදාගන්නා රාගය

(1) භූපාලි රාගයයි. (2) බිලාවල් රාගයයි. (3) කාෆි රාගයයි. (4) යමන් රාගයයි.

09. | x x | x x x | ලෙස අවනද්ධාක්ෂර විභාග වන හින්දුස්ථානි තාලය වන්නේ,

(1) ධාදරා තාලයයි. (2) ජප් තාලයයි. (3) දීප්චන්දි තාලයයි. (4) ත්‍රිතාලයයි.

10. රාගයේ අලංකාරය සඳහා ශුද්ධ, කෝමල, තිව්‍ර ස්වර සියල්ල විවාදි ස්වර ලෙස යොදාගතහැකි රාගය ලෙස නම් කළ හැක්කේ,

(1) භෛරවී රාගයයි. (2) භූපාලි රාගයයි. (3) බිලාවල් රාගයයි. (4) යමන් රාගයයි.

11. මාත්‍රා 18 කින් යුතු දේශීය විරිත වන්නේ,

(1) ගී විරිතයි. (2) මුවරද විරිතයි. (3) සමුද්‍රඝෝෂ විරිතයි. (4) බහසුරු විදහ විරිතයි.

12. දේශීය ලක්‍ෂණ වලින් යුක්ත මුල් යුගයේ ගුවන්විදුලි සරළ ගී ගායක යුගලයක් වන්නේ,

(1) එච්. ඩබ්. රූපසිංහ - සුනිල් සාන්තය (2) රුක්මණී දේවි - ජමුණා රාණිය

(3) ආනන්ද සමරකෝන් - සුනිල් සාන්තය (4) ආනන්ද සමරකෝන් - රුක්මණී දේවිය

13. දීප්චන්දි තාලයට ගැයෙන ගීත දෙකකි

(1) සිනහවෙන් හෝ කථාවෙන් බෑ / සැඳෑ කළුවර කුර ගගා විත්

(2) සසර වසන තුරු / මුහුදු පතුල යට ඉදලා

(3) මිහිකත නළවාලා / ලංකා ලංකා පෙම්බර ලංකා

(4) රන්වන් කරල් සැලෙයි / ලෝකයක් නසන්නට

14. සිතාරයේ ප්‍රධාන තත සුසර කරගනු ලබන ස්වරය වන්නේ,

(1) මන්ද්‍ර පංචමයටයි. (2) මන්ද්‍ර සඩ්ජයටයි. (3) මන්ද්‍ර මධ්‍යමයටයි. (4) මධ්‍ය සඩ්ජයටයි.

15. ''මනමත් කරවන දන මුළු දෙරනා'' මෙම ගීතය

(1) දොළොස්මත් සේ ගීයකි. (2) විසිමත් සේ ගීයකි.

(3) දස අටමත් සේ ගීයකි. (4) සොළොස්මත් සේ ගීයකි.

16. විශමග්‍රහ ලක්‍ෂණය විදහා පාමින් ගැයෙන ගී පාදයකි.

(1) | වෙ න | ද s s s | එ s න s | (2) | ව ර ළ ස | නි ල් පැ හැ |

(3) |+ අත ක | ට ගෙ න | (4) | ඉ ප ල් | පි ටි න් |

17. රබීන්ද්‍ර ගීත හෙවත් බෙංගාලි ගීතවල නිර්මාතෘ වන්නේ,

(1) භාත්ඛණ්ඩේ පඬිතුමා ය. (2) තාගෝර් තුමා ය.

(3) රවි ශංකර් තුමා ය. (4) ශකීර් හුසේන් ය.

18. | ගප ධනි ස̇රි̇ ස̇නි | ධප මග මරි ස- | මෙම තානාලංකාරය අයත් ඔබගේ විෂය නිර්දේශිත රාගය වන්නේ,

(1) බිලාවල් රාගයයි. (2) යමන් රාගයයි. (3) කාෆි රාගයයි. (4) භෛරවී රාගයයි.

19. වයලීනයක තත් පෙරදිග ක්‍රමයට සුසර කර ගැනීමේ (Tune) ක්‍රම දෙකක් වන්නේ,

(1) ප̣ රි ධ ග̇ - ම රි̇ ධ රි̇ ලෙසයි. (2) ම̣ ස ප රි̇ - ප රි̇ ධ ග ලෙසයි.

(3) ප̣ ස ප ස̇ - ම̣ ස ප රි̇ ලෙසයි. (4) ස̣ ප ස ප - ප̣ ස ප රි̇ ලෙසයි.

20. දකුණු ඉන්දීය කර්ණාටක සංගීත ආභාසය ලද නාට්‍ය ගීත විශේෂයක් වන්නේ,

(1) නූර්ති ය (2) කෝලම් ය (3) නාඩගම් ය (4) සොකරි ය

21. ''රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදී දී විදුලිය පබා'' මෙම ගී පාදය ගැයෙන තිත වනුයේ,

(1) සුළු මැදුම් දෙතිතටයි. (2) මැදුම් මහ දෙතිතටයි.

(3) සුළු මහ දෙතිතටයි. (4) දෙසුළු මහ තුන් තිතටයි.

22. 

ඉහත බටහිර ප්‍රස්තාරයේ ඇතුළත් ස්වර පෙරදිග ක්‍රමයට ලියූවිට දැක්විය හැක්කේ,

(1) | ස ස ස | රි රි රි | ග - රි | ස - - | යනුවෙනි.

(2) | ස ස ග - | රි රි ම - | ග ග ප - | ම ධ ප - | යනුවෙනි.

(3) | ස ස ග ග | රි රි ම ම | ග ග ප ප | ම ධ ප ප | යනුවෙනි.

(4) | ස ස රි - | රි̱ රි̱ ම - | ග ග ප - | ම ධ̱ ප - | යනුවෙනි.

23. ඉහත බටහිර ප්‍රස්තාරයෙන් දැක්වෙන ගීතය

(1) සරළ ගීතයකි. (2) නූර්ති ගීතයකි. (3) ස්වර ස්ථාපන ගීතයකි. (4) ළමා ගීතයකි.

24. 22 වැනි ප්‍රශ්නයට අදාළ බටහිර ස්වර ප්‍රස්තාරයේ යෙදී ඇති ස්වර සංකේත වන්නේ,

(1) සෙමිබ්‍රීව් සහ මිනිම් ය. (2) ක්‍රොචට් සහ ක්වේවර් ය.

(3) ක්‍රොචට් සහ මිනිම් ය. (4) ක්වේවර් සහ ක්‍රොචට් ය.

25. ප්‍රශස්ති ගායනයේ ආරම්භක යුගය ලෙස සැලකෙන්නේ,

(1) අනුරාධපුර යුගයයි. (2) පොළොන්නරු යුගයයි.

(3) කෝට්ටේ යුගයයි. (4) දඹදෙණි යුගයයි.

26. වයලීනය සහ මැන්ඩලීනය වාදනය කිරීමේ දී යොදාගනු ලබන උපකරණ වන්නේ,

(1) මිස්රාබය හා පික් (Pick) වේ. (2) බෝව (Bow) සහ පික් (Pick) වේ.

(3) මිස්රාබය සහ බෝව (Bow) වේ. (4) බෝව (Bow) සහ ක්වාලම් වේ.

27. ස්වර වාද්‍ය ගණයට ගැනෙන භාණ්ඩ යුගලක් වන්නේ,

(1) එස්රාජය සහ මද්දලයි. (2) මද්දල සහ තබ්ලාවයි.

(3) තබ්ලාව සහ බටනලාවයි. (4) බටනලාව සහ එස්රාජයයි.

28. ''සඳ රැස් ගලා'' හෝ ''චංඩෝ චංඩෝ චෙලා''..... ලෙස ආරම්භක වචන සහිතව ගැයෙන ගීතය අයත් රාගය වන්නේ,

(1) යමන් රාගයයි. (2) බිලාවල් රාගයයි. (3) කාෆි රාගයයි. (4) භූපාලි රාගයයි.

29. ප්‍රකට ඉන්දීය තබ්ලා වාද්‍ය ශිල්පීන් දෙදෙනෙකි

(1) රවිශංකර් සහ උදය ශංකර් (2) ශිව කුමාර් ශර්මා සහ ප්‍රතාප් රන්ධීර් සිං

(3) විශ්වනාත් ලවුජි සහ අලගනායිඳු (4) අල්ලා රක්ඛා ඛාන් සහ ශකීර් හුසේන්

30. ''දැනට වළලූ මල් මුතු වැල් මාල පොටයි'' යන ජන ගී ආශ්‍රිත සරළ ගීතයේ නිර්මාතෘ වන්නේ,

(1) සී. ද එස්. කුලතිලක මහතාය. (2) රෝහණ බැද්දගේ මහතා ය.

(3) ලයනල් රංවල මහතා ය. (4) නීලා වික්‍රමසිංහ මහත්මිය ය.

31. ''ගල් ලෙන බිඳලා - ලෙන් දොර ඇරලා'' යන ගීතය ඇතුළත් නාට්‍යය වන්නේ,

(1) මනමේ නාට්‍යයයි. (2) කුවේණි නාට්‍යයයි.

(3) කාලගෝල නාට්‍යයයි. (4) සිංහබාහු නාට්‍යයයි.

32. හින්දුස්ථානි රාගධාරී සංගීතයේ ඛ්‍යාල ගීතයක ප්‍රධාන කොටස් දෙක වන්නේ,

(1) ස්ථායි සහ අන්තරා වේ. (2) කායදු සහ පල්ටා වේ.

(3) ආරෝහණ සහ අවරෝහණ වේ. (4) සම් සහ බලි වේ.

33. මප, මපධ, පධ, පධනි ..... මෙම ස්වර අභ්‍යාසයේ ආරම්භක ස්වර වන්නේ,

(1) ස̇ නි , ස̇ නි ධ වේ. (2) ස රි , ස රි ග වේ.

(3) ධ නි , ධ නි ස̇ වේ. (4) රි ග , රි ග ම වේ

34.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | Ⓐ | ऽ | ධා | ධා | Ⓑ | ऽ | තා | Ⓒ | ऽ | ධා | ධා | Ⓓ | ऽ |
| x | | | 2 | | | | 0 | | | 3 | | | |

ඉහත හින්දුස්ථානී තාලයේ 2A හිස්තැනට සහ 9C හිස්තැනට අදාළ අවනද්ධාක්ෂර වන්නේ (පිළිවෙලින්)

(1) තිං සහ ධිං වේ. (2) ධා සහ ධිං වේ.

(3) ධිං සහ තිං වේ. (4) නා සහ තා වේ.

35. ''මෝරා බීජයෙනා.....'' ගීත කොටස අයත් වනුයේ,

(1) නෛයඩි වන්නමට යි. (2) තිසරා වන්නමට යි.

(3) උකුසා වන්නමට යි. (4) හනුමා වන්නමට යි.

36. නාඩගම් සංගීත ලක්ෂණ සහිත නව නාට්‍යයකි.

(1) මුහුදු පුත්තු නාට්‍යය (2) මනමේ නාට්‍යය

(3) තාරාවෝ ඉගිලෙති නාට්‍යය (4) හුණුවටය නාට්‍යය

37. රි ග ම' ධ නි යන ස්වර සඳහා භාවිත කළ හැකි තනි යෙදුමක් වන්නේ,

(1) විකෘති ස්වර යනුවෙනි. (2) කෝමල, තීව්‍ර ස්වර යනුවෙනි.

(3) ශුද්ධ කෝමල ස්වර යනුවෙනි. (4) මුඛ්‍යාංග යනුවෙනි.

38. වන්නම් ගායනා සහ හටන් ගී ගායනාවල ආරම්භක ස්ථානය ලෙස හඳුන්වන්නේ,

(1) වේදිකාවයි. (2) කවිකාර මඩුවයි. (3) රජමාළිගාවයි. (4) කරළියයි.

39. ගුත්තිල කාව්‍ය ග්‍රන්ථයේ රචකයා ලෙස හැඳින්වෙන්නේ,

(1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය. (2) වෑත්තෑවේ හිමියන් ය.

(3) මිහිඳු හිමියන් ය. (4) ශ්‍රී සුමංගල හිමියන් ය.

40. ගීත පාදයක (+) ලකුණින් සංකේතවත් කරන්නේ,

(1) සම් හෙවත් සමග්‍රහයයි. (2) බලි හෙවත් දුර්වල ස්ථානයයි.

(3) අනුතාල ස්ථානයයි. (4) අවග්‍රහය හෙවත් නිහඬ මාත්‍රාවයි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**උපදෙස් :**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) (i) ජප් තාලයට සමාන මාත්‍රා බෙදෙන දේශීය තිත් රූපය නම් කරන්න.

(ii) බිලාවල් රාගයේ අනුවාදී ස්වර මොනවා ද?

(iii) ''බුද්ධං සරණේ සිරස දරාගෙන'' මෙම ගී පාදයේ සඳැස්මත් ගණන කීයද?

(iv) රාගවල විස්තර ඇතුළත්ව නිර්මාණය කර ඇති ගීත විශේෂය කුමක් ද?

(v) ස රි ස රි ග , රි ග රි ග ම ........ යන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර ලියන්න.

- **හිස්තැන් පුරවන්න.**

(vi) නාඩගම් නාට්‍ය රංග භූමිය ලෙස .................................. යොදාගත් අතර කෝලම් රංග භූමිය ................................. ලෙස හඳුන්වයි.

(vii) එස්රාජයේ ප්‍රධාන තත .......................................... ලෙස හඳුන්වයි.

(viii) ඖඩව ජාතියට අයත් රාගයකි ................................................

(ix) බටහිර සංගීතයේ දී 4/4 Time Signature එකට ගැලපෙන හින්දුස්ථානි තාලය කුමක් ද?

(x) නූර්ති සඳහා ආභාෂය ලබා ඇත්තේ කුමන සංගීත සම්ප්‍රදාය ද?

(xi) හින්දුස්ථානි සංගීතයේ එන මධ්‍යලය ගීතයක කොටස් මොනවා ද?

(xii) 𝅗𝅥 ♩ ♪ මෙම බටහිර ස්වර සංකේතවලට අයත් නම් පිළිවෙලින් ලියන්න. (ලකුණු 1 x 12 = 12)

(02) පහත දී ඇති නිර්දේශිත රාගවලට අදාළ තොරතුරු අයත් රාග හඳුනාගෙන නම් කරන්න.

(a) A සර්ව කෝමල රාගයකි.

B කල්‍යාණ මේලගත රාගයකි.

C එක් විකෘති ස්වරයක් පමණක් යෙදේ.

D ම ස්වරය හා ස ස්වරය වාදී සංවාදී වේ.

E උදය කාලයේ ගැයේ

F ග ස්වරය හා නි ස්වරය වාදී සංවාදී වේ. (ල. ½ x 3 = 03)

(ii) ඉහත රාග අතරින් ඔබ කැමති රාගයක මධ්‍යලය ගීතයක / වාදිතයක ස්ථායි අන්තරා කොටස් ප්‍රස්තාර කරන්න. (ල. 06)

(iii) ඔබ උගත් වෙනත් රාගයකට අයත් ආරෝහණ, අවරෝහන, මේලය, ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 12)

(03) පහත සඳහන් කරුණුවලට අදාළ හින්දුස්ථානි තාල හඳුනාගන්න.

A විභාග 4 කි. මාත්‍රා 14 කි.

B විභාග 2 කි මාත්‍රා 8 කි.

C විභාග 4 කි. මාත්‍රා 16 කි.

D විභාග 2 කි. මාත්‍රා 6 කි.

(i) A, B, C, D කොටස්වලට අදාළ හින්දුස්ථානි තාල පිළිවෙලින් නම් කරන්න. (ල. 04)

(ii) ඉහත තාල අතරින් ඔබ කැමති තාල දෙකකට අදාළ දේශීය තිත් නම් කරන්න. (ල. 04)

(iii) ''නිල් අහස් තලේ අගේ'' යන ගීත පාදය ගැළපෙන තාලයකට අනුව පද ප්‍රස්තාර කරන්න. (ල. 02)

(iv) D අක්ෂරයට අයත් තොරතුරුවලට ගැලපෙන තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 02)

(මුළු ලකුණු 12)

(04) ඔබ උගත් නාට්‍ය ශෛලීන් දෙකක තොරතුරු පහත දැක්වේ.

A කමත රංග භූමිය ලෙස යොදාගනී.

B පහතරට බෙරය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.

C සශ්‍රීකත්වය උදෙසා පවත්වයි.

D ගැටබෙරය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.

E වෙස් මුහුණු පලඳී.

F තානායම්පොල නැමති ස්ථානයේ රඟ දක්වයි.

(i) මෙම නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න. (ල. 02)

(ii) නම් කරන ලද නාට්‍ය ශෛලීන් දෙකට අදාළ කරුණු නිවැරදිව වෙන් කර ලියන්න. (ල. 03)

(iii) ඉහත කරුණුවලට අමතරව එක් නාට්‍ය ශෛලියක් සඳහා සුවිශේෂී කරුණු දෙකක් ලියන්න. (ල. 04)

(iv) ඔබ උගත් නූර්ති ගීතයක මුල් කොටස ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 12)

(05) (i) ජන ගී වර්ගීකරණයට අනුව ගැමි ගී වර්ග තුන මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

(ii) එම වර්ග සඳහා උදාහරණය බැගින් ලියන්න. (ල. 03)

(iii) ඔබ උගත් සේ ගීයක මුල් පාදය ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 12)

(06) (i) තබ්ලාවක රූප සටහනක් ඇඳ කොටස් 4 ක් නම් කරන්න. (ල. 04)

(ii) තබ්ලා වාදන අංග 2 ක් නම් කරන්න. (ල. 02)

(iii) තබ්ලාවේ දායාවෙන් සහ බායාවෙන් නිකුත්වන අක්ෂර 2 බැගින් ලියන්න. (ල. 04)

(iv) හින්දුස්ථානි සංගීතයේ ප්‍රකට තබ්ලා වාදකයෙකු නම් කරන්න. (ල. 02)

(මුළු ලකුණු 12)

(07) පහත සඳහන් මාතෘකා අතරින් 3 ක් තෝරාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

| | | | |
|---|---|---|---|
| (1) | කපිරිඤ්ඤා ගායන ශෛලිය | (2) | ඩබ්. බී. මකුලොලුව මහතා |
| (3) | නාදයේ ත්‍රිවිධ ගුණ | (4) | ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගැමි ගී |
| (5) | පංචතූර්ය නාද | (6) | සමග්‍රහ |

(ල. 3 x 4 = 12)

(මුළු ලකුණු 12)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2020**

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(1) | 4 -(3) | 5 -(3) | 6 -(3) | 7 -(2) | 8 -(3) | 9 -(2) | 10 -(1) |
| 11-(3) | 12 -(3) | 13 -(1) | 14 -(3) | 15 -(4) | 16 -(1) | 17 -(2) | 18 -(1) | 19 -(3) | 20 -(3) |
| 21-(2) | 22 -(2) | 23 -(3) | 24 -(2) | 25 -(3) | 26 -(2) | 27 -(4) | 28 -(2) | 29 -(4) | 30 -(1) |
| 31-(4) | 32 -(1) | 33 -(2) | 34 -(3) | 35 -(3) | 36 -(2) | 37 -(1) | 38 -(2) | 39 -(2) | 40 -(4) |

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

## II පත්‍රය

(01) (i) සුළු මැදුම් දෙතිත (ii) ස රි ම ප නි (iii) 16 (iv) ලක්ෂණ ගීත
(v) ගම ගමප (vi) කරලිය, තානායම්පොල (vii) බජ්කා තාර්
(viii) (ix) භූපාලි (x) ත්‍රිතාලය / කෙහෙර්වා
(xi) හින්දුස්ථානි
(xii) 𝅗𝅥 ♩ ♪ මෙම බටහිර ස්වර සංකේතවලට අයත් නම් පිළිවෙලින් ලියා තිබිය යුතුයි. (ලකුණු 1 x 12 = 12)

(02) (i) අදාළ තොරතුරු රාගවලට වෙන් කිරීම සඳහා (ල. ½ x 6 = 03)
(ii) මධ්‍යලය ගීතයක ස්ථායි අන්තරා නිවැරදිව ප්‍රස්තාර කිරීම සඳහා (ල. 06)
(iii) රාගයට අයත් ආරෝහණ, අවරෝහන මේලය ලියා තිබීම (ල. 03)
(මුළු ලකුණු 12)

(03) (i) තාල පිළිවෙලින් නම් කිරීම සඳහා (ල. 04)
(ii) තාල දෙකකට අයත් දේශීය තිත් නම් කිරීම (ල. 04)
(iii) නි ල් අ | හ ස් ත | ලේ s අ | ගේ s s | ලෙස ප්‍රස්තාර කර තිබීම (ල. 02)
(iv) D අක්ෂරයට අයත් තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීමට (ල. 02)
(මුළු ලකුණු 12)

(04) (i) නාට්‍ය දෙක නම් කිරීම සඳහා (ල. 02)
(ii) නාට්‍ය දෙකට අයත් තොරතුරු වෙන් කර ලිවීම සඳහා (ල. ½ බැගින් 03)
(iii) ඉහත කරුණුවලට අමතරව එක් නාට්‍ය ශෛලියක් සඳහා සුවිශේෂ කරුණු දෙකක් ලිවීම සඳහා (ල. 04)
(iv) නූර්ති ගීතයක ස්ථායි කොටස ලිවීමට (ල. 03)
(මුළු ලකුණු 12)

(05) (i) ගැමි ගී වර්ග තුන පැහැදිලි කිරීම සඳහා (ල. 06)
(ii) උදාහරණය බැගින් ලිවීමට (ල. 03)
(iii) ඔබ උගත් සේ ගියක මුල් පාදය ලියන්න. (ල. 03)
(මුළු ලකුණු 12)

(06) (i) තබ්ලාවක කොටස් නම් කිරීම සඳහා (ල. 04)
(ii) තබ්ලා වාදන අංග දෙකක් සඳහා (කායදා / පල්ටා / රේලා / තිහායි) (ල. 02)
(iii) තබ්ලාවේ දායාවෙන් සහ බායාවෙන් නිකුත්වන අක්ෂර 2 බැගින් ලිවීමට (ල. 04)
(iv) හින්දුස්ථානි සංගීතයේ ප්‍රකට තබ්ලා වාදකයෙකු නම් කිරීම (ල. 02)
(මුළු ලකුණු 12)

(07) එක් මාතෘකාවක් සඳහා ලකුණු 4 බැගින් (මුළු ලකුණු 12)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

| | | |
|---|---|---|
| (01) | ඔබ කැමති රාගයක සර්ගම් හෝ මධ්‍යලය ගීතයක් ගායනය / වාදනය | (ලකුණු 20) |
| (02) | ගුරුවරයා නම් කරන තාලයක් තාල තැබීම | (ලකුණු 20) |
| (03) | නූර්ති හෝ නාඩගම් ගීතයක් ගායනය, වාදනය කිරීම | (ලකුණු 20) |
| (04) | ස්වර පුවරුවෙන් ගිතයක් වාදනය හෝ තබ්ලාවෙන් කායදාවක් පල්ටාවක් වාදනය | (ලකුණු 20) |
| (05) | සරල ගීතයක් හෝ නව නාට්‍ය ගීතයක් ගායනය හෝ වාදනය | (ලකුණු 20) |